# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2019 දෙසැම්බර් මස 27 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2019.12.30 දින නිකුත් කරන ලදී)**

# විසි දෙවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

(පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ පනත් කෙටුම්පතකි)

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## විසි දෙවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත විසි දෙවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යනුවෙන් හඳුන්වනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**2.** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (මින් මතුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව" යනුවෙන් හඳුන්වනු ලබන) 41ඇ වන ව්‍යවස්ථාවේ (1), (2), (3) සහ (4) අනුව්‍යවස්ථාවන් මෙමගින් පරිච්ඡින්න කොට පහත සඳහන් අනුව්‍යවස්ථාවන් ආදේශ කරමින් සංශෝධනය කරනු ලැබේ:—

"41 ඇ. (1) මෙම ව්‍යවස්ථාවේ උපලේඛනයේ පළමුවන කොටසේ සඳහන් විනිශ්චයකරුවන් පත්කිරීමේ දී ජනාධිපතිවරයා අධිකරණ සේවා කොමිෂන් සභාවේ අදහස් විමසීමෙන් පසුව පත්කිරීම සිදු කළ යුතු ය.

(2) මෙම ව්‍යවස්ථාවේ උපලේඛනයේ දෙවන කොටසේ සඳහන් නිලධාරීන් පත්කිරීමේ දී ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයාගේ අදහස් විමසීමෙන් පසුව පත්කිරීම් සිදු කළ යුතු ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**3.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 වන ව්‍යවස්ථාවේ (2) අනුව්‍යස්ථාවට පසුව (2)(අ) වශයෙන් පහත සඳහන් ඡේදය එකතු කිරීම මඟින් සංශෝධනය කරනු ලැබේ:—

"(අ) ජනාධිපතිවරයා ආරක්ෂක අමාත්‍ය ධුරය දැරිය යුතු අතර, වෙනත් යම් අමාත්‍යාංශ ද ඔහු යටතේ පවත්වාගෙන යා හැකි ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**4.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46 වන ව්‍යවස්ථාවේ (1) අනුව්‍යවස්ථාවේ (ආ) ඡේදයේ සඳහන් "හතළිහ" යන වචනය ඉවත් කොට "තිහ" යන වචනය ආදේශ කිරීම මඟින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**5.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46 වන ව්‍යවස්ථාවේ (4) සහ (5) අනුව්‍යවස්ථාවන් පරිච්ඡින්න කිරීම මඟින් එම ව්‍යවස්ථාව සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**6.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 වන ව්‍යවස්ථාවේ (1) අනුව්‍යවස්ථාවේ "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සභාවේ අනුමැතියට යටත්ව" යන වචනය ඉවත් කිරීම මඟින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඉ වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**7.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඉ ව්‍යවස්ථාවේ (6) ඡේදයේ "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සභාවේ අනුමැතිය යටත්ව" යන වචනය ඉවත් කිරීම මඟින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**8.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.